01. “**නාවිකයා**” **සමාජ ආරක්ෂණ ඔප්පු ප්‍රදානෝත්සවය**
(2023.02.01 - **වරාය**, **නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරය**)

රටට ආර්ථිකමය වශයෙන් ඉතා වැදගත් දායකත්වයක් සපයනු ලබන වෘත්තීය කණ්ඩායමක් වන වෙළඳ නාවික ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිතව සේවා නියුක්ත නාවිකයින් වෙත ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ වෙළඳ නාවික ලේකම් කාර්යාලය ඒකාබද්ධව ඉකුත් වර්ෂයේදී හඳුන්වාදුන් “නාවිකයා” සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමය සඳහා සේවායෝජක නැව් සමාගම්හි අනිවාර්යය වූ මුල්‍ය දායකත්වය මත සාමාජිකත්වය ලැබූ පළමු නාවිකයින් කණ්ඩායම සඳහා සමාජ ආරක්ෂණ ඔප්පු ප්‍රදානය 2022.02.01 දින පෙරවරුවේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයෙදී පැවැත්විය

අන්තර්ජාතික කම්කරු සංවිධනයේ 2006 සමුද්‍රීය කම්කරු ප්‍රඥප්තියට අනුකූලව වෙළඳ නාවිකයන් සඳහා අවශ්‍ය සමාජ ආරක්ෂණය සැපයීම සඳහා හඳුන්වා දුන් මෙම සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික විධිවිධාන සලසා 2022 වර්ෂයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අංක 2292/18–2022 ඇති විශේෂ  ගැසට් පත්‍රය මගින් සැපයීමෙන් අනතුරුව ප්‍රථම සාමාජිකත්වය ලද නාවිකයින් කණ්ඩායම ලෙස ACME International Shipping (Pvt)Ltd මගින් රැකියාව සඳහා පිටත්ව යන සහ පිටත්ව ගිය 40 දෙනෙකුගෙන් යුත් නාවිකයින් පිරිසක් මේ සඳහා ඇතුළත් විය.

ඔප්පු ප්‍රදානෝත්සවය වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය  අමාත්‍ය ගරු අනුප පස්කුවල් මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

මෙම අවස්ථාව සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය











අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ACME International Shipping (Pvt)Ltd යන ආයතනයන්හි නිලධාරීන් රැසක් ද සහභාගී විය.

## 02. “ආරස්සාව” පළමු සාමාජිකා රශ්මි නිමේෂා දියණියට අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ
**(2023.03.31 - සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරය)**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් “ආරස්සාව” පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රථම සාමාජිකාව වූ රශ්මි නිමේෂා දිරිය දියණිය විශ්ව විද්‍යාල වරම් හිමිකරගැනීම මත ඇයට හිමි රුපියල් ලක්ෂ 200,000.00 ක අධ්‍යාපන කඩඉම් ප්‍රතිලාභ ප්‍රදානය සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්, විශ්වවිද්‍යාල වරම් හිමිකරගත් දරු දැරියන් වෙත ප්‍රතිලාභ ප්‍රදානය ඇතුලුව නව සාමාජිකත්වය ලද දරු දැරියන් වෙත විශ්‍රාම වැටුප් ඔප්පු ප්‍රදානය, සමාජ සවිබලගැන්වීම් ගරු රාජ්‍ය අමාත්‍ය අනූප පස්කුවල් මැතිතුමා සුරතින් 2023.03.31 දින සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයෙ දී පැවැත්විය

මෙම අවස්ථාව සඳහා කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් යමුනා පෙරේරා මහත්මිය, එම අමාත්‍යාංශ අතිරේක ලේකම්











(සංවර්ධන III) හේමා පෙරේරා මහත්මිය සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති පී.එස්.එස්.දික්වැල්ල මහතා ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් ද සහභාගී විය.

## 04. ගම්පහ දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - ගම්පහ" උත්සවය, දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඬිකෝරාළ මහතා සහ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු පී.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.07.07 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය.

මෙහිදී ගම්පහ දිස්ත්‍රික්කයේ සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයිමට ලක්විය. මෙහි දී ආරස්සාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාගය සමත් වූ











දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.

## 05. උතුරු හා නැගෙනහිර පළාත් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන පිරිස් සඳහා ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ උතුරු, නැගෙනහිර පළාත් හී වැඩිම දායකත්වය දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ “සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2023 - උතුරු හා නැගෙනහිර පළාත්” උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති ජ්‍යේෂ්ඨ ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.07.13 වන දින ත්‍රිකුණාමලය JKAB හොටෙල් පරිශ්‍රයේදී පැවැත්විය.

මෙහිදී උතුරු, නැගෙනහිර පළාත් හී සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇගයීමට ලක්විය. මෙහි දී ආරස්සාව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාගය සමත් වූ











දරුවන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ද, වයස 60 සම්පූර්ණ වූ වැඩිහිටි අය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම ද සිදුවිය.

## 06. බදුල්ල දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2023

රජයේ විශ්‍රාම වැටුපක් අහිමි ජනතාවගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහාශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය වෙත සාමාජිකයින් බඳවාගනිමින්එය ව්‍යාප්ත කිරීමට දායකත්වය ලබා දුන් රාජ්‍ය නිලධාරීන් ඇගයීම සඳහා වූ ඇගයීම් උත්සවයක් (සම්මාන උළෙලක්) බදුල්ලදිස්ත්‍රික් ලේකම් ශ්‍රී පණ්ඩුක ප්‍රභාත් අභයවර්ධන මහතා හා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති ශාන්ත දික්වැල්ල මහතාගේ ප්‍රධාත්වයෙන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) කල්හාරිද සිල්වා මහත්මිය, සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) ෂර්මිලා ප්‍රනාන්දු මෙනවිය ඇතුළු තවත්රාජ්‍ය නිලධාරීන් රැසකගේ සහභාගිත්වයෙන් 2023.08.04 වන දින බදුල්ල දිස්ත්‍රික් ශ්‍රවනාගාරයේදීපැවැත්විය.

සම්මාන උළෙල තුළදී, 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදීඉහළදායකත්වයක් දක්වන ලද ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සමෘද්ධිසංවර්ධන නිලධාරීන් ඇතුළු රාජ්‍ය











නිලධාරීන් රැසක් ඇගයීමට ලක්විය.

එමෙන්ම මෙහිදී වයස 60 සම්පූර්ණ කළ සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ ආරක්ෂාව පුරවා සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලද දරු දැරියන් වෙත අධ්‍යාපන කඩයිම් ප්‍රතිලාභ ප්‍රදානයද සිදුකරන ලදී.

**07. වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියාවිරහිත තරුණ තරුණියන් රැකියාගත කිරීමේ වැඩසටහන**.

තරුණ තරුණියන් සඳහා **වෘත්තීය මාර්ගෝපදේශන හා** රැකියාගතකිරීමේ වැඩසටහනක් යුනියන් ඇෂුවරන්ස් රක්ෂණ සමාගමේ සම්පත් දායකත්වයත් ද සහිතව, මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී 2023 සැප්තැම්බර් මස 6 වන දින පැවැත්විණි.

මෙම වැඩසටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම හා වලල්ලාවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ අ.පො.ස. උසස් පෙළ හදාරා අවසන් සහ මේ වනවිට රැකියා විරහිත හෝ ස්ථිර රැකියාවක නොයෙදෙන තරුණ තරුණියන් 200 ක පිරිසක සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය, අලෙවිකරණය සහ නායකත්වය යන ක්ෂේත්‍ර











සම්බන්ධයෙන් වැඩමළුවක් පැවැත්වීමටත් එම තරුණ කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සමාජ ආරක්ෂණ උපදේශකවරුන් ලෙස රැකියා සඳහා රැකියාගතකිරීමට ද කටයුතු කරන ලදී.